ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ඉන්දියානු නාවික හමුදා කණ්ඩායම **Commandant's Cup Sailing Regatta – 2023** ශූරතාවය දිනා ගනී</u>

එක් නිලධාරියකුගෙන් සහ කැඩෙට් නිලධාරීන් තිදෙනෙකුන් සමන්විත වූ එළිමාලා හි ඉන්දියානු නාවික ඇකඩමි (INA) කණ්ඩායම ත්‍රිකුණාමලයේ නාවික සහ සමුද්‍රීය ඇකඩමිය විසින් 2023 ජනවාරි 09-11 දිනයන් හිදි සංවිධානය කරන ලද Commandant's Cup Sailing Regatta – 2023 රුවල් යාත්‍රා තරඟාවලියේ රන් පදක්කම දිනා ගැනීමට සමත් විය. මෙම තරඟාවලිය සඳහා රටවල් 5ක් සහභාගී විය.

2. ශ්‍රී ලංකා නාවික හමුදාපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා මහතා ජයග්‍රාහකයන් වෙත පදක්කම් ද 2023 තරඟාවලියේ කුසලානය ද පිරිනැමීය. 2023 ජනවාරි 12 වන දින ජයග්‍රාහී කණ්ඩායම හමු වූ මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ඔවුන්ගේ ජයග්‍රහණය අගය කළේය.

3. INA කණ්ඩායම Commandant's Cup තරඟාවලිය සඳහා සහභාගි වීම ඉන්දියානු නාවික හමුදාව "මිත්‍රත්වයේ පාලම්" ගොඩනැගීමට ගන්නා ප්‍රයත්නය හා සමපාත වේ. ත්‍රිකුණාමලයේ නාවික සහ හමුදා ඇකඩමියේ එක් නිලධාරියකුගෙන් සහ කැඩෙට් නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් 2022 දෙසැම්බර් 04-10 දක්වා ඉන්දියානු නාවික ඇකඩමියේ පැවති Admiral's Trophy Sailing Regatta තරඟාවලිය සඳහා සහභාගි විය. 2022 දෙසැම්බර් 15 වන දා සිට 2023 ජනවාරි 15 වන දා දක්වා ඉන්දියාවේ පැවැත්වෙන සාගර යාත්‍රා පුහුණු පාඨමාලාවකට ශ්‍රී ලංකා කණ්ඩායමක් සහභාගි වේ. එසේම, සාගර යාත්‍රාවේ යෙදෙන ඉන්දීය නාවික හමුදා යාත්‍රා නෞකා පහක් 2022 මාර්තු 10 -19 දිනවල ශ්‍රී ලංකාවට පැමිණි අතර එහිදී ශ්‍රී ලංකා නාවික හමුදා සාමාජිකයන් සඳහා සාගාර යාත්‍රා පුහුණුව සහ අත්දැකීම් ලබා දෙන ලදී. මෙයට අමතරව, ශ්‍රී ලංකාවේ ඉල්ලීමක් අනුව 2022 මාර්තු මාසයේදී ඉන්දීය නාවික හමුදාව විසින් යාත්‍රා බෝට්ටු 10ක් සඳහා යාත්‍රා උපකරණ ලබා දෙන ලදී. ඉන්දියාවේ "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තිය මත පදනම් වූ ඉන්දියානු සහ ශ්‍රී ලංකා නාවික හමුදාවන් අතර සහයෝගීතා වැඩසටහන් හි අරමුණ වන්නේ කාර්ය සහයෝගීතාවය, සහෝදරත්වය සහ ක්‍රීඩාශීලිත්වය ශක්තිමත් කිරීම යි.

***

කොළඹ
2023 ජනවාරි 13